## UNIVERSITY OF PERADENIYA

## CENTRE FOR DISTANCE AND CONTINUING EDUCATION

**ශාස්ත්‍රවේදී උපාධි (බාහිර - නව නිර්දේශය) පරීක්ෂණය 100 මට්ටම - 2020** [redacted]

**கலைத்தேர்வுப் பரீட்சை (வெளிவாரி–புதிய பாடத்திட்டம்) 100 வது தேர்ச்சி மட்டம் –** [redacted] **2020**

**Bachelor of Arts (External OLD Syllabus) Examination 100 Level –**[redacted]**2020**

**ECG 1: ආර්ථික විද්‍යාව I**

උපදෙස් :

1. අඩු වශයෙන් එක් කොටසකින් ප්‍රශ්න දෙකක් තෝරා ගනිමින් ප්‍රශ්න පහකට **(05)** පිළිතුරු සපයන්න.
2. මෙම ප්‍රශ්න පත්‍රයේ අඩංගු මුළු ප්‍රශ්න සංඛ්‍යාව අටකි (08). කාලය : පැය තුනයි (03).
3. එක් එක් ප්‍රශ්නයට අදාළ ලකුණු සංඛ්‍යාව දක්වා ඇත. මුළු ලකුණු : 100
4. ප්‍රස්තාර කොළ සපයනු ලැබේ. ගණක යන්ත්‍ර භාවිතයට අවසර ඇත.

---

### **I** වන කොටස

1. i උපයෝගිතාවය සහ ආන්තික උපයෝගිතාවය යන සංකල්පයන් ගෙන් අදහස් කරන්නේ කුමක්ද? (ලකුණු 5)

   ii හීනවන ආන්තික උපයෝගීතා න්‍යාය ප්‍රකාශ කරන්න. (ලකුණු 5)

   iii යම් පාරිභෝගිකයෙකු X සහ යන භාණ්ඩ දෙක පරිභෝජනය කිරීමෙන් ලැබූ ආන්තික උපයෝගිතාවන් පහත දක්වා ඇත. X වල ඒක්ක මිල රු. 2 වන අතර Y වල ඒකක මිළ රු. 3 කි.

| ඒකක | $MU_x$ (යුටිල්) | $MU_y$ (යුටිල්) |
|---|---|---|
| 1 | 20 | 24 |
| 2 | 18 | 21 |
| 3 | 16 | 18 |
| 4 | 14 | 15 |
| 5 | 12 | 9 |
| 6 | 10 | 3 |

   අ. පාරිභෝගික ආදායම රු. 24 ක් නම්, සමතුලිතයෙදී එම පුද්ගලයා මිලට ගන්නා X සහ Y භාණ්ඩ ප්‍රමාණයන් සොයන්න. (ලකුණු 5)

   ආ. X සහ Y අතර ආන්තික ආදේශන අනුපාතය ($MRS_{XY}$) සොයන්න. සමතුලිතයෙදී $MRS_{XY}$ හි අගය සොයන්න. (ලකුණු 5)

2. i සංඛ්‍යා සූචක උපයෝගීතාව සහ ක්‍රම සූචක උපයෝගිතාවඅතර වෙනස පහදන්න. (ලකුණු 4)

   ii උපේක්ෂා වක්‍රය නිර්වචනය කර එහි ලක්ෂණයන් සඳහන් කරන්න. (ලකුණු 4)

   iii උපේක්ෂා වක්‍රය උපයෝගී කරගෙන, පාරිභෝගික සමතුලිතය පහැදිලි කරන්න. සමතුලිතය සඳහා වන කොන්දේසි ප්‍රකාශ කරන්න. (ලකුනු 4)

   iv උපේක්ෂා වක්‍ර ප්‍රවේශය උපයෝගී කර ගනිමින්, යම් භාණ්ඩයක් සඳහා උපේක්ෂා වක්‍රය ව්‍යුත්පන්න කරන්න. (ලකුනු 4)

   v මිල වෙනස්වීමක ආදේශන ප්‍රතිවිපාකය සහ ආදායම් ප්‍රතිවිපාකය අතර වෙනස පහදන්න. (ලකුනු 4)

3. i නිෂ්පාදන ශ්‍රිතයක් යන්නෙන් අදහස් කරන්නේ කුමක්ද? පැහැදිලි කරන්න. (ලකුණු 5)

ii ශ්‍රමයේ සාමාන්‍ය ඵලදාව සහ ශ්‍රමයේ ආන්තික ඵලදාව අතර සම්බන්ධතාවය විස්තර කරන්න. (ලකුණු 5)

iii [redacted]ලදා න්‍යාය සහ පරිමාණානුකූල ඵල අතර වෙනස පැහැදිලි කරන්න. (ලකුණු 5)

iv සාමා[redacted]හ ආන්තික පිරිවැය වක්‍රයන් අතර සම්බන්ධතාව විස්තර කරන්න. (ලකුණු 5)

4. i පූර්ණ තරඟකාරී වෙළඳපොලක මූලික ලක්ෂණයන් ප්‍රකාශ කරන්න. (ලකුණු 5)

ii පූර්ණ තරඟකාරී ආයතනයක කෙටි කාලීන සමතුලිතතාව දැක්වීමට ප්‍රස්තාරයක් අඳින්න. (ලකුණු 5)

iii ඒකාධිකාරී ආයතනයක් සඳහා උදාහරණයක් සපයන්න. ඔබ එය ඒකාධිකාරී ආයතනයක් ලෙස සැලකීමට හේතු විස්තර කරන්න. (ලකුණු 5)

iv ඒකාධිකාරී වෙළඳපලේ සමාජ ශුභ සාධනය සහ සම්පත් බෙදා හැරීම කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 5)

## II වන කොටස

5. i ජාතික ආදායමේ සමතුලිත මට්ටම යන්නෙන් ඔබ අදහස් කරන්නේ කුමක්ද? පැහැදිලි කරන්න. (ලකුණු 4)

ii යම් ආර්ථිකයක් සඳහා පහත තොරතුරු දී ඇත.

| | |
|---|---|
| පරිභෝජනය | $C = 60 + 0.8Y_d$ |
| වැය කල හැකි ආදායම | $Y_d$=Y-T |
| ආයෝජනය | I=100 |
| රාජ්‍ය වියදම | G=100 |
| බදු | T=100 |
| නිර්යාත | X=50 |
| ආයාත | M=70 |

(අ) සමතුලිත ආදායම් මට්ටම තීරණය කරන්න. (ලකුණු 4)

(ආ) ඉතුරුම් ශ්‍රිතය සොයා එය ප්‍රස්තාරයක ඇඳ දක්වන්න. (ලකුණු 4)

(ඇ) බදු ගුණකය සොයා එය පැහැදිලි කරන්න. (ලකුනු 3)

(ඈ) ආන්තික පාරිභෝජන නැඹියාව (MPC) අර්ථ දක්වන්න. MPC 0.7 දක්වා අඩු වුවහොත් එය සමතුලිත ආදායම් මට්ටම කෙරේ දක්වන්න. (ලකුණු 5)

6. i මුදල් සැපයුම යනු කුමක්ද? මුදල් සැපයුම තීරණය කරන්නේ කුමක් මගින්ද? පැහැදිලි කරන්න. (ලකුණු 5)

ii අධි බලැති මුදල් සහ මුදල් ගුනකය අතර සම්බන්ධතාවය පැහැදිලි කරන්න. (ලකුණු 5)

iii මූල්‍ය ප්‍රතිපත්තිය යනු කුමක්ද? එහි අරමුණු මොනවාද? (ලකුණු 5)

iv ෆිස්කල් හිඟය යන්නෙන් අදහස් කරන්නේ කුමක්ද? පැහැදිලි කරන්න. (ලකුණු 5)

7. i උද්ධමනය යනු කුමක්ද? ශ්‍රී ලංකාවේ එය මිනුම් කරන්නේ කෙසේද? (ලකුණු 5)

ii පිරිවැයෙන් තල්ලු කරන ලද උද්ධමනයට හේතු වන ප්‍රධාන සාධකයන් ප්‍රකාශ කරන්න. (ලකුණු 5)

iii උද්ධමනය යම් ආර්ථිකයක ආදායම් ව්‍යාප්තියට සහ ස්ථිර ආදායම් උපයන්නන්ට බලපෑම් කරන්නේ කෙසේද? පැහැදිලි කරන්න. (ලකුණු 5)

iv යම් ආර්ථිකයක උද්ධමනය සහ සේවා වියුක්තිය එකිනෙක මත රඳා පවතින්නේද? (ලකුණු 5

8. පහත ඒවා පිළිබඳව කෙටි සටහන් ලියන්න.

i නාමික විනිමය අනුපාතය සහ මූර්ත විනිමය අනුපාතය

ii ෆිස්කල් ප්‍රතිපත්ති සහ මූල්‍ය ප්‍රතිපත්ති

iii ව්‍යාපාර චක්‍ර වල අදියරයන්

iv මුදල් ගුණකය (කොටසකට ලකුණු 5)

දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය- පේරාදෙණිය විශ්වවිද්‍යාලය
தொடர் தொலைக் கல்வி நிலையம் பேராதனைப- பல்கலைக்கழக
CENTRE FOR DISTANCE AND CONTINUING EDUCATION- UNIVERSITY OF PERADENIYA

ශාස්ත්‍රවේදී සාමාන්‍ය උපාධි පරීක්ෂණය (බාහිර පැරණි නිර්දේශය) - 2020

## ආර්ථික විද්‍යාව II
## ECG 2: තුලනාත්මක ආර්ථික සංවර්ධනය

**උපදෙස්:**

- මෙම ප්‍රශ්න පත්‍රයේ අඩංගු ප්‍රශ්න සංඛ්‍යාව **08** කි
- ඕනෑම ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න
- කාලය - **පැය තුනයි**

---

1. (i). 'වැඩවසම් වාදය' යන්නෙන් ඔබට හැඟෙන්නේ කුමක්ද? (ලකුණු 05)

   (ii). එංගලන්තයේ වැඩවසම් ක්‍රමය බිඳවැටීමට හේතුවූ බලවේගයන් විවේචනාත්මකව විභාග කරන්න. (ලකුණු 15)

2. "බ්‍රිතාන්‍යය ආර්ථික සංවර්ධනයේදී කෘෂිකාර්මික සහ කාර්මීක අංශ අතර වඩාත් අනුකූලවූ (harmonic) සම්බන්ධතාවයක් ඉදිරිපත්කරයි." මෙම ප්‍රකාශය අනුව 19 වන ශතවර්ෂයේ බ්‍රිතාන්‍යය ආර්ථික වෘධියේදී කෘෂිකාර්මික සහ කාර්මික අංශයන් සිදුකළ සාපේක්ෂ දායකත්වයන් සාකච්ඡාකර කරන්න. (ලකුණු 20)

3. 19 වන ශත වර්ෂයේ මහා බ්‍රිතාන්‍යයේ සහ ජර්මනියේ ආර්ථික වෘධි ක්‍රියාවලිය තුල හඳුනාගත හැකි සමානකම් සහ වෙනස්කම් මොනවාද? (ලකුණු 20)

4. (i). ජර්මනියේ 'සොල්වරීනයෙහි' (Zollverein) ප්‍රධාන ලක්ෂණ විස්තර කරන්න. (ලකුණු 05)

   (ii). 19 වන ශත වර්ෂයේ ජර්මනියේ අභ්‍යන්තර වෙළඳාමේ ප්‍රසාරණය මගින් ආර්ථික සංවර්ධනය සිදුකිරීම සඳහා සොල්වරීනයෙහි මූලික දායකත්වයන් සාකච්ජා කරන්න . (ලකුණු 15)

5. 19 වන ශත වර්ෂයේදී ප්‍රංශයේ සිදුවූ ප්‍රධාන ජනවිද්‍යාත්මක වෙනස්වීම් සාකච්ඡාකර කරන්න. (ලකුණු 20)

6. (i). සෝවියට් රුසියාවේ නව ආර්ථික ප්‍රතිපත්තිවල (NEP) ප්‍රධාන ලක්ෂණ දක්වන්න. (ලකුණු 05)

   (ii). නව ආර්ථික ප්‍රතිපත්ති එරට ආර්ථික සංවර්ධනයට කල බලපෑම පිළිබඳ ඇගයීමක් කරන්න (ලකුණු 15)

7. සෝවියට් සාමූහිකරණය රුසියානු කෘෂිකාර්මික සංවර්ධනයට අවාසිසහගත එකක්විය. ඔබ එකඟ වන්නේද? හේතු දක්වන්න. . (ලකුණු 20)

8. පහත දැක්වෙන ඒවායින් <u>ඕනෑම</u> **<u>හතරක්</u>** පිළිබඳව කෙටි සටහන් ලියන්න

(i). 'නව ආදර්ශ වෘත්තීය සමිති'

(ii). 'නිර්බාධවාදී'ප්‍රතිපත්තිය (laissez-fair)

(iii). 1760 – 1830 අතර එංගලන්තයේ කපු කර්මාන්තය

(iv). නෝෆෝක් ක්‍රමය (The Norfolk system)

(v). චාටිස්ට් ව්‍යාපාරය

(4 × 5 = ලකුණු 20)

**************************

දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය - පේරාදෙණිය විශ්වවිද්‍යාලය
தொடர் தொலைக் கல்வி நிலையம் - பேராதனைப் பல்கலைக்கழகம்
CENTRE FOR DISTANCE & CONTINUING EDUCATION – UNIVERSITY OF PERADENIYA

## General Degree Examination in Arts (External Old Syllabus) 2020

ආර්ථික විද්‍යාව III

ECG 3 ව්‍යවහාරික ආර්ථික විද්‍යාව

ඕනෑම **ප්‍රශ්ණ පහකට** (5) පිළිතුරු සපයන්න.
මෙම ප්‍රශ්න පත්‍රයේ ඇති සමස්ත ප්‍රශ්න ගණන **දහයකි** (10)
ඒ ඒ ප්‍රශ්ණයට ලබාදෙන ලකුණු ප්‍රමාණය දක්වා ඇත.
කාලයඃ පැය **තුනක්** (3) පමණයි

---

1. (i) 1948 නිදහස ලබන විට ශ්‍රී ලංකාවට තිබූ "මුල් වාසි" ('Early advantages') පහ (5) පැහැදිලි කරන්න. (ලකුණු 05යි)

   (ii) 1977ට පෙර ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනයේ ප්‍රධාන ලාක්ෂණික සාකච්ඡා කරන්න. (ලකුණු 15යි)

2. (i) 1977 දී රජය විසින් හඳුන්වාදුන් ප්‍රධාන ආර්ථික ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණ 5ක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05යි)

   (ii) 1977 දී හඳුන්වා දුන් ප්‍රතිසංස්කරණවලින් පසු ආර්ථික කාර්යසාධනයට සිවිල් යුද්ධය සහ දකුණේ කැරැල්ල වැනි අභ්‍යන්තර ගැටලු බලපෑවේ කෙසේද? (ලකුණු 05යි)

   (iii) මූර්ථ ඒක පුද්ගල දළ දේශීය නිමවුමේ ඉහළ යාමක් යනු ආර්ථිකයේ සිටින සෑම පුද්ගලයෙක්ම පෙරට වඩා යහපත් මටමටමකට පත් වූවේය යන්න ද? එසේ නම් හෝ එසේ නොවේනම් ඊට හේතු මොනවාද? (ලකුණු 10යි)

3. (i) ශ්‍රී ලංකාවේ දරිද්‍රතාවයේ මූලික ලාක්ෂණික විස්තර කරන්න. (ලකුණු 08යි)

   (ii) දුප්පතුන් පිළිබඳව ඔබ දන්නා ප්‍රධාන ලාක්ෂණික මත පදනම්ව, ශ්‍රී ලංකාවේ දරිද්‍රතාව අවම කිරීමට ප්‍රයෝජනවත් විය හැකි ක්‍රියාමාර්ග මොනවාදැයි ගෙනහැර දක්වන්න. (ලකුණු 12යි)

4. (i) ශ්‍රී ලංකාවේ භාවිත කරන අර්ථයෙන් "වැඩකළ හැකි වයසේ ජනගහනය" ('Working Age Population'), "ශ්‍රමබලකා සහභාගිත්ව අනුපාතය" ('Labour Force Participation Rate') සහ "සේවා වියුක්ත අනුපාතය" ('Unemployment Rate') යන යෙදුම් නිර්වචනය කරන්න. (ලකුණු 06යි)

   (ii) පසුගිය දසක දෙක තුළ පුරුෂ සහ කාන්තා යන දෙපාර්ශවයේම වැඩකළ හැකි වයසේ ජනගහන අනුපාතයේ සහ සේවා වියුක්ත අනුපාතයේ ප්‍රවනතා විස්තර කරන්න. (ලකුණු 08යි)

   (iii) කාන්තා ශ්‍රමබලකා සහභාගිත්ව අනුපාතය වැඩි කිරීමට ඇති සංරෝධක මොනවාදැයි විස්තර කර ඒවා අවම කර කාන්තා ශ්‍රමබලකා සහභාගිත්ව අනුපාතය වැඩි කිරීම සඳහා ඔබගේ යෝජනා ලබා දෙන්න. (ලකුණු 06යි)

5. (i) කෘෂිකර්මාන්තය වෙත ප්‍රධාන රාජ්‍ය මැදිහත්වීම් පහක් (5) හඳුනාගෙන, එම මැදිහත්වීම් සාර්ථක වුවේද නැතිනම් අසාර්ථක වූවේද යන්න කෙටියෙන් දක්වන්න. (ලකුණු 12යි)

(ii) ගැටලු සහ අභියෝග ඉස්මතු කරමින් කෘෂිකාර්මික අංශයේ කාර්යසාධනය ඇගයීමට ලක්කරන්න. (ලකුණු 08යි)

6. (i) පහත දැක්වෙන කාල පරාස යටතේ ප්‍රධාන කාර්මීකරණ මූලෝපාය විස්තර කරන්න. (ලකුණු 10යි)

(a) 1977ට පෙර ආනයන ආදේශන
(b) 1977ට පසු අපනයන ප්‍රවර්ධන

(ii) ආර්ථිකය කාර්මීකරණය සහ විදේශ විනිමය ඉපැයීම යන අර්ථයෙන් ආනයන ආදේශන සහ අපනයන ප්‍රවර්ධන මූලෝපායවල ප්‍රතිඵල සංසඳනය කරන්න. (ලකුණු 10යි)

7. (i) 1960 ගණනන්වල සිට ශ්‍රී ලංකාවේ බදු ආදායමේ සංයුතිය වෙනස් වූ ආකාරය කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 10යි)

(ii) ශ්‍රී ලංකාවේ විශාල අයවැය හිඟයේ සාර්වආර්ථික බලපෑම් සකච්ඡා කරන්න. (ලකුණු 10යි)

8. (i) සාමාන්‍යයෙන් ශ්‍රී ලංකාවේ ගෙවුම් ශේෂයේ ජංගම ගිණුම හිගයක් ඇතිවීමට හේතු සාකච්ඡා කරන්න. (ලකුණු 10යි)

(ii) ශ්‍රී ලංකාවේ වෙළෙඳ ශේෂය පැහැදිලි කිරීමේදී පහත සඳහන් සාධක කොතරම් වැදගත්ද? ප්‍රතිපත්ති වෙනස්වීම් ලෙස ඔබ නිර්දේශ කළ හැක්කේ කුමක්ද? ඊට හේතු දක්වන්න. (ලකුණු 10යි)

(a) විනිමය අනුපාතිකය කළමනාකරණය
(b) අපනයන විවිධාංගීකරණය

9. ශ්‍රී ලංකාවේ ආර්ථිය සඳහා කොවිඩ් -19 යේ බලපෑම විවේචාත්මකව විමසන්න. (ලකුණු 20යි)

10. ශ්‍රී ලංකාවේ ආර්ථිකය සම්බන්ධයෙන් පහත දැක්වෙන ඕනෑම හතරක් (4) පිළිබඳව කෙටිසටහන් ලියන්න. (එක් කොටසකට ලකුණු 05 බැගින්)

(a) ඒක පුද්ගල ආදායම
(b) තරුණ සේවාවියුක්ති
(c) දරිද්‍රතා මිණුම්
(d) ජනගහනයේ ව්‍යුහය
(e) රාජ්‍ය වියදමේ සංරචක
(f) සමුර්ධි වැඩසටහන
(g) තිරසාර සංවර්ධනය

---